## සේරුවිල ප්‍රාදේශීය සභාව

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 24 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 22 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 පෙබරවාරි මස 20 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව සේරුවිල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී භාවිතා කරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මෙහෙයුම් කටයුතු සහ ආදායම් ඉපයීම සඳහා භාවිතා කර තිබූ රු. 34,770,040 ක ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන්කර නොතිබීමෙන් සභාවේ තත්‍ය වියදම ගිණුම්වල දක්වා නොතිබුණි.

### 1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු.**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ)** සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන උතුරු නැගෙනහිර පළාත් සේවා ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ (NELSIP) සමාලෝචිත වර්ෂය අවසානයේ වූ රු.5,248,869 ක මුදල් පොතේ ශේෂය ගිණුම්වලට ගෙන නොතිබුණි.

**(ආ)** ඒකාබද්ධ ලැබීම් සාරාංශය අනුව පුනරාවර්තන ආදායම රු. 10,307,904 ක් වුවද,රු. 5,131,224 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.5,176,680 ක පුනරාවර්තන ආදායම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

**(ඇ)** කඩකුලී හිමියන් 32 දෙනෙකුට අදාලව වටිනාකම රු. 239,079 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**(ඈ)** සේරුවිල පූජා භූමි කඩ කාමර ඉදිකිරීමේ තත්‍ය වියදම රු. 6,506,143 ක් වුවද, රු. 5,998,484 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි. ඒ අනුව ස්ථාවර වත්කම් රු. 507,659 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඉ)** කඩකාමර ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට වර්ෂය අවසානයේ ගෙවිය රු.606,143 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 1.3.3 **ගිණුම් පොත්පත් පවත්වා ගැනීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් **කරනු ලැබේ.**

**(අ)** ගෙවීම් මුදල් පොත, ස්ථාවර වත්කම් ලේඛනය සහ උපකරණ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ආ)** හිඟ ආදායම්, මාසික ඒකාබද්ධ වැය විශ්ලේෂණය, මාසික ඒකාබද්ධ වැය සාරාංශය, මාසික ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය යන ප්‍රාදේශීය සභා ආකෘති යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

### 1.3.4 **නීති,රීති රෙගුලාසිවලට අනුකූල නොවීම.**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති,රීති , රෙගුලාසි සහ විධි විධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| <u>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| **(අ)** <u>ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 1988</u> | |
| (i) I වැනි පරිච්ඡේදය,වගන්ති අංක 5 (XI) | මුදල් සඳහා රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි. |
| (ii) I වැනි පරිච්ඡේදය,වගන්ති අංක 5 (XII) | මුදල් භාරකරුවන්ගේ ඇප සහතික ලබා ගෙන නොතිබුණි. |
| (iii) රීති මාලාවේ 59 වැනි රීතිය | සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර ආයතන පිළබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබීම. |
| **(ආ)** රාජ්‍ය පරිපාලන පලාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | සභාව සතු වාහන 09 සම්බන්ධයෙන් මාස 06 කට වරක් ඉන්ධන දහනය පරික්ෂා කර නොතිබුණි. |
| (ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| (i) මු.රෙ. 396 | රු. 22,605 ක් වටිනා මාස 06 ක කාලය ඉක්මවා තිබූ නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 507 | 2012 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 783,948 ක් වූ පුස්තකාල පොත් සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (iii) මු.රෙ. 570 | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු රු. 81,101 ක ශේෂයක් වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුණද නිරවුල්කිරීමට හෝ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,553,654 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,780,841 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය.

සමාලෝචිත වර්ෂයේ තත්‍ය වියදම සහ අයවැයගත ප්‍රතිපාදන අතර සියයට 18 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා නොගත් අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය.

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සහ හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තත්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (I) | වරිපනම් හා බදු | 05 | - | 05 |
| (II) | බදු කුලී | 1,968 | 1,178 | 2,579 |
| (III) | බලපත්‍ර ගාස්තු | 146 | 234 | - |
| (IV) | වෙනත් ආදායම් | 4,322 | 3,719 | 603 |

#### 2.3.2 ආදායම් සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පැනවීම

සභාව විසින් 2012 මැයි මස 22 දින බේකරි, පදික වෙළදාම, මාළු අලෙවි කිරීම, ත්‍රිරෝද රථ නැවතුම් ස්ථාන වැනි ආදායම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථා සහා අනුමැතිය ලබා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත නමුත් මේ දක්වා එම ව්‍යවස්ථා නීතිගත කර නොතිබුණි.

**2.3.3 කඩකුලී.**

2012 වර්ෂයට අදාළව ලැබිය යුතු කඩ කුලී රු. 203,313 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.4 උසාවි දඩ.**

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2012 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් ලැබිය යුතු රු. 10,108,413ක් ලබා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

**2.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජන භෞතික සම්පත්.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2008 ජනවාරි මිලදීගත් රු. 1,000,000 ක් වටිනා මහේන්ද්‍රා කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා පියවර නොගැනීම හේතුවෙන් වර්ෂයකට වැඩි කාලයක් භාවිතයෙන් ඉවත්කර තිබුණි.

**(ආ)** රු. 287,500 ක් වටිනා රෝද දෙකේ ට්‍රැක්ටරය සහ රු. 350,000 ක් වටිනා යුනිමෝ අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස නිර්දේශ කර ඇතත් ඒවා සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.5 කොන්ත්‍රාත් පරිපාලනය.**

සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු. 76,476,444 ක් වටිනා කොන්ත්‍රාත් දින 221 සිට දින 504 දක්වා වූ පරාසයක ප්‍රමාද වී නිමකර ඇති නමුත් ගිවිසුම් ප්‍රකාර ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**(අ)** ත්‍රිකුණාමලය පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතින් සභාවට පරිත්‍යාග වශයෙන් ලැබුණු එකතුව රු. 4,900,000 ක පිරිවැය වූ වාහන 07 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** රු.13,961,229 කට අදාළ ඉඩම් හා ගොඩනැගිලි සඳහා හිමිකම් ඔප්පු ලබාගෙන නොතිබුණි.

## 2.7 මානව සම්පත් කළමනාකරණය.

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව.**

2012 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තත්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සෙවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 02 | 01 | 01 |
| ද්විතික මට්ටම | 08 | 05 | 03 |
| තෘතීය මට්ටම | 14 | 05 | 09 |
| **එකතුව** | 24 | 11 | 13 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** පුස්තකාලයාධිපති තනතුර සහ ආදායම් සුපරීක්ෂක තනතුර පුරප්පාඩුව පැවතුණි.

**(ආ)** තෘතීය මට්ටමේ සේවකයින්ගේ පුරප්පාඩුව පැවතීම හේතුවෙන් එකී වැඩ කටයුතු ආවරණය කිරීම සඳහා ආදේශක හා දෛනික පදනම මත සේවකයින් බඳවා ගෙන රු. 592,118 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

## 03. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) මානව සම්පත් කළමනාකරණය